සබරගමුව පළාත 2009

1. මූල්‍ය ප්‍රකාශන

----------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------

(අ) පළාත් සභා අරමුදල් ගිණුම

------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2010 ජූනි 24 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

(ආ) අනෙකුත් ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2010 ජූනි 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2009 වර්ෂයට අදාළ | | | |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 28 | 28 | - | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - | - |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 25 | 23 | 02 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 06 | - | - |
| (v) | අරමුදල් ගිණුම් | 03 | 02 | 01 | - |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 02 | 01 | 01 | - |
| | | 65 | 61 | 04 | 01 |

1.2 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සබරගමුව පළාත් සභාවේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි

මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම / ගනුදෙනු මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ආදායම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | රු. | | රු. | | රු. |
| (අ) ගිණුම්වල වැඩියෙන් දැක්වීම | 02 | 94,139,238 | 16 | 1,282,429 | 15 | 7,536,347 |
| (ආ) ගිණුම්වල අඩුවෙන් දැක්වීම | | | 27 | 33,267,092 | | |
| එකතුව | 02 | 94,139,238 | 43 | 34,549,521 | 15 | 7,536,347 |

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.41,172,249 ක් වූ අතර, උපයෝගි ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.45,233,065 ක් විය.

1.3.3 බැංකු සැසඳුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාස 06 ක කාලයක් ඉක්මවා නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වටිනාකම රු.42,045,800 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) අගය රු.2,505,134 ක් අගරු චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණ.

(ඇ) බැංකු ගිණුම් 07 කට අදාල හඳුනා නොගත් හර රු.142,390 ක් වූ අතර, බැංකු ගිණුම් 12 කට අදාලව හඳුනා නොගත් බැර රු.2,484,872 ක් විය.

1.3.4 අග්‍රිම ගිණුම්

--------------

2009 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ රු.19,973,528 ක් වූ අග්‍රිම හර ශේෂ හා රු.3,770,033 ක් වූ බැර ශේෂ තිබුණි.

1.3.5 පොදු තැන්පත් ගිණුම්

-------------------------

මුදල් රෙගුලාසි 571 විධි විධාන ප්‍රකාරව, කටයුතු කළ හැකිව තිබුණ ද , එසේ කටයුතු නොකළ 2009 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබූ පොදු තැන්පත්වල වටිනාකම රු.26,260,358 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

-----------------------------------

2009 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 58 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.21,011,441 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

--------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.404,473 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 අනුකූල නොවීම

-----------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 11 වගන්තිය | සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් අවශ්‍ය රීති සකස් කර අනුමත කර නොගැනීම. |
| (ආ) | 2008 අංක 09 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මඟින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ xvii පරිච්ඡේදයේ 153 (1) වගන්ති | එකතුව රු.182,388 ක් වූ බදු මුදල අඩුකර නොතිබුණි. |
| (ඇ) | 1893 අංක 08 දරන උකස් ආඥා පනතේ 24 වගන්තිය | උකස් මධ්‍යස්ථාන 02 ක් විසින් වාර්ෂික බලපත්‍ර අලුත් නොකිරීම. |
| (ඇ) | 2008 සබරගමුව පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහය | |
| (i) | 54.1 වගන්තිය | රු.40,300 ක් වටිනා ජංගම දුරකථන 2 ක් නැති වීම් සම්බන්ධයෙන් අදාල ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | 261.2.2 වගන්තිය | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 03 කට අදාලව අවස්ථා 2 ක දී ලබා දුන් එකතුව රු.247,827 ක් වූ අතුරු අග්‍රිම ප්‍රමාද වී පියවා තිබුණු අතර, අවස්ථා 17 ක දී ලබා දුන් එකතුව රු.271,382 ක් වූ අතුරු අග්‍රිම අදාල කාර්යයට යොදා නොගෙන අත රඳවාගෙන සිට පියවා තිබුණි. |
| (iii) | 471.1 වගන්තිය | ප්‍රධාන අමාත්‍යවරයා සහ මහජන සම්බන්ධතා නිලධාරි වෙත නිකුත් කර තිබූ රු.37,230 ක් |

| | | |
|---|---|---|
| | | වටිනා ජංගම දූරකථන 03 බඩු ලේඛන පොත්වල ඇතුළත් කර නොතිබුණි. |
| (iv) | 476 වගන්තිය | කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පාසැල් 327 ක 2007, 2008 හා 2009 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2006 ජනවාරි 04, 2006 මාර්තු 18 හා 2007 නොවැම්බර් 01 දිනයන්හි අංක සිඑස්ඒ/පී1/40 දරන ශ්‍රී ලංකා ජනාධිපතිගේ කාර්යාල වියදම් කළමනාකරණ චක්‍රලේඛ | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත ඉන්ධන වෙනුවෙන් රු.312,480 ක් හා ඉඩම්, පළාත් වාරි මාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, පරිසර කටයුතු සහ ධීවර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත ඉන්ධන වෙනුවෙන් රු.289,440 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ) | 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඑෆ්/427 දරන හා 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | වාහන 05 ක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමේ හා ජනශක්ති රක්ෂණ සමාගමේ රක්ෂණය කිරීම වෙනුවෙන් රු.338,989 ක් ගෙවීම් කර තිබුණි. |
| (උ) | රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ 2000 ජුනි 27 දිනැති අංක බීඩී/පීඊ/3/2000 දරන චක්‍රලේඛය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දි මුදල් අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද , ඊට පටහැනිව 2009 දෙසැම්බර් 31 දිනට රු.12,191,011 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඌ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) | 3.4.3 (ඇ) වගන්තිය | රු.91,557,930 ක් වටිනා ක්‍රීඩා ඇඳුම් මිල දී ගැනීමේ දී ලියා පදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා නොතිබුණි. |
| (ii) | 3.6.1. (අ) සහ (ඇ) වගන්ති | අවිධිමත් ලෙස ආරක්ෂක සහ පවිත්‍රතා සේවා සැපයීමේ ප්‍රසම්පාදනය එකම ආයතනයක් වෙත පිරි නැමීම |
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය හි මු.රෙ. 104 හා 105 | 1991 සිට 2004 වර්ෂය දක්වා සිදුවී තිබුණු අලාභ හානි 150 ක් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඊ) | 2009 මාර්තු 12 දිනැති අංක එෆ්සී/එම්ර්/ප්ප්ප්න්/2009 දරන මුදල් කොමිෂන් සභා සභාපතිගේ ලිපිය | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ ලැයිස්තුව ප්‍රධාන ලේකම් විසින් අනුමත කර 2009 සැප්තැම්බර් 30 දිනට පෙර මුදල් කොමිෂන් සභාව වෙත එවිය යුතු බව දන්වා තිබිය දී එකතුව රු.57,586,590 ක් වූ සංවර්ධන වැඩ විෂයයන් 110 ක් නියමිත දිනට පසු ප්‍රධාන ලේකම් විසින් අනුමත කර තිබුණි. |

2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.83,047,438 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.369,827,314 ක් විය.

2.1 ආදායම් හා වියදම්

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

| | 2009 | | | 2008 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැය ගත | තථ්‍ය | විචලනය | අයවැය ගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම් | | | | | | |
| බදු ආදායම | 1,465,400,000 | 1,146,644,488 | 318,755,512 | 833,560,000 | 1,012,847,196 | 179,287,196 |
| බදු නොවන ආදායම් | 313,600,000 | 273,053,142 | 40,546,858 | 217,170,000 | 250,020,396 | 32,850,396 |
| රජයේ ප්‍රදාන | 12,011,491,184 | 10,193,813,607 | 1,817,677,577 | 11,643,249,000 | 9,603,761,030 | (2,039,487,970) |
| වෙනත්විදේශ ආධාර | - | 197,924,953 | (197,924,953) | 200,000,000 | 227,103,250 | 27,103,250 |
| | ------------ | ------------ | ---------- | ---------- | ----------- | ----------- |
| | 13,790,491,184 | 11,811,436,190 | 1,979,054,994 | 12,893,979,000 | 11,093,731,872 | 1,800,247,128 |

| | වියදම | | | | | |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| | 8,624,003,000 | 8,233,926,088 | 390,076,912 | 8,384,840,230 | 7,769,386,108 | 615,454,122 |
| පෞද්ගලික පඩිනඩි | | | | | | |
| අනෙකුත් | 2,047,817,000 | 1,737,906,906 | 309,910,094 | 1,742,408,770 | 1,461,840,028 | 280,568,742 |
| උප එකතුව | 10,671,820,000 | 9,971,832,994 | 699,987,006 | 10,127,249,000 | 9,231,226,136 | 896,022,864 |
| ප්‍රාග්ධන වියදම් | 2,674,339,000 | 1,756,555,758 | 917,783,242 | 2,622,000,000 | 1,492,678,423 | 1,129,321,581 |
| මුළු එකතුව | 13,346,159,000 | 11,728,388,752 | 1,617,770,248 | 12,749,249,000 | 10,723,904,559 | 2,025,344,445 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.11,728,388,752 ක් විය. ඉන් 85 % ක් පුනරාවර්තන වියදම් වූ අතර, 15 % ක් මූලධන වියදම් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

(අ) ගිණුම් ඉදිරිපත් කර ඇති පසුගිය වර්ෂ 03 ක එම එක් එක් වර්ෂය අවසානයට හිඟ ආදායම පිළිබඳව තොරතුරු පහත දැක්වේ. (පළාත් සභාවේ සියළුම ආදායම් ශීර්ෂවල)

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2009 | 2008 | 2007 |
| | | රු. | රු. |
| බදු ආදායම | 51,653,107 | 47,106,845 | 69,021,887 |
| බදු නොවන ආදායම | 3,392,773 | 3,453,429 | 2,712,540 |
| | 55,045,880 | 50,560,274 | 71,734,427 |

(ආ) 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා පළාත් පාලන බල මණ්ඩල 24 කට අදාලව ලැබී තිබූ උසාවි දඩ මුදල් රු.64,947,451 ක් පළාත් පාලන බල මණ්ඩලවලට යවා නොතිබුණි.

(ඇ) 1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 12 වගන්තිය ප්‍රකාරව, බදු ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් දඩයක් ගෙවිය යුතු වුවත්, බදු ලිපිගොනු 07 ක් පරීක්ෂාවේ දී බදු අයවීමෙන් පසු වහාම අදාල ලිපිගොනුව පරීක්ෂා නොකිරීම හේතුවෙන් එකතුව රු.337,379 ක් වූ දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට පැවැත එන එකතුව රු.1,295,184 ක් වූ හිඟ බදු හා දඩ මුදල් වලට අදාල නඩු 19 ක් 2010 පෙබරවාරි මස වන විට ද නොවිසඳී පැවැතුණි.

(ඉ) විගණිත දිනය වන විට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පැවැති බදු ලිපිගොනු සංඛ්‍යාව 7693 ක් වූ අතර, නිරන්තරයෙන් පරික්ෂාවක් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් බදු අයකර ගැනීමට නොහැකි වී ඇති ලිපිගොනු සංඛ්‍යාව 2045 ක් වූ අතර, එකී ලිපිගොනු සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඊ) 1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වගන්තිය ප්‍රකාරව, යම් කාර්තුවකට අදාල පිරිවැටුම් බද්ද ඒ කාර්තුව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසයේ 15 වන දින ඉක්ම වීමට පෙර ගෙවිය යුතු වුවත්, ඊට පටහැනි ලෙස බදු ලිපිගොනු 08 කට අදාලව 1996 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා බදු ගෙවා නොතිබුණි.

(උ) කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 විසින් බදු දී ඇති හෙක්ටයාර් 6.809 ක් වූ ඉඩම් වෙනුවෙන් 2009 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බදු හා දඩ ප්‍රමාණය රු.13,950,655 ක් විය.

## 2.3 අනුමත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 69 නියමයට හා සබරගමුව පළාත් සභා මුදල් රීති 33 දැක්වෙන නියමයන්ට පටහැනිව නිසි අධිකාර බලයක් නොමැතිව වැඩසටහන්, ව්‍යාපෘති හා වැය විෂයයන් (1001-1003 - පෞද්ගලික පඩිනඩි හැර ) වල පළාත් සභාව විසින් නියම කරන ලද ප්‍රතිපාදනයන් ඉක්මවා රු.38,068,968 වියදමක් දරා තිබුණි.

## 2.4 අත්තකාරම් ගිණුම්වල සීමාවන් පිළිනොපැදීම

ශ්‍රී ලංකා ජනරජයේ මදල් රෙගුලාසි 503 හා පළාත් සභා මුදල් රීති 367 හි නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයයන් 01 ක වියදමෙහි උපරිම සීමාව රු.43,291 කින් ද ,

විෂයයන් 04 ක හර ශේෂයේ උපරිම සීමාව රු.5,742,404 කින් ද ඉක්මවා තිබූ අතර, විෂයයන් 07 ක ලැබීම්වල අවම සීමාව රු.9,923,671 කින් පහත වැටී තිබුණි.

## 2.5 කාරක පාඩු

වාණිජ අත්තිකාරම් ගිණුම් 03 ක පසුගිය වර්ෂ 03 ක දී දිගින් දිගටම කාරක පාඩු වාර්තා වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ කාරක පාඩුව රු. 28,428,851 කි. මුදල් රෙගුලාසි 513 විධි විධාන අනුව යථෝක්ත කාරක පාඩු ආවරණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබු

අතර. අත්තිකාරම් ගිණුම් පාඩු පිට පවත්වාගෙන යාමේ ආර්ථික හා සමාජ සාධාරණත්වය පිළිබඳව කළමණාකාරිත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

2.6 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

2.6.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව
-------------------------------------

2009 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු , ආයතන

| | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 952 | 756 |
| සහායක | 3428 | 2571 |
| සුළු සේවක | 2126 | 1676 |
| වෙනත් (අනියම් , තාවකාලික) | 38 | 73 |
| | 6544 | 5076 |

(ආ) පාසල් කාර්ය මණ්ඩල

| | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විදුහල්පති | 975 | 638 |
| ගුරුභවතුන් | 17256 | 17182 |
| සුළු සේවක | 873 | 443 |
| වෙනත් (අනියම් , තාවකාලික) | 55 | 180 |
| | 19159 | 18443 |

මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත් වී අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කල නිලධාරීන් 07 දෙනෙකු සිටිය දී වැඩ ආවරණය කිරීම සඳහා පත් කර තිබුණු ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ නිලධාරීන් තුන් දෙනෙකු ඇඹිලිපිටිය, ගොඩකවෙල හා කොලොන්න කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු ලෙස පත් කර තිබුණි.

ii. 3-5 වසර වල ඉංග්‍රීසි විෂයය සඳහා පාසැල් 72 ක එකම ගුරුවරයකුවත් නොසිටින අතර, පාසැල් 3 ක ගුරු ඌනතා 03 ක් ද 6-11 වසර වල ඉංග්‍රීසි විෂයයට අදාලව පාසැල් 31 ක ගුරු ඌනතා 31 ක් ද පාසැල් 11 ක ගුරු අතිරික්තතා 14 ක් ද පැවැතුණි.

iii. 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ස්ථාවර කමිටුවක් විසින් නම් කරනු ලබන පාසලක හෝ පහසු පාසැල් වර්ගයට අයත් පාසලක සේවය කළ හැකි උපරිම කාලය අවුරුදු 08 ක් වුවත්, ඊට පටහැනිව නිවිතිගල කලාපයේ ගුරුවරු 142 දෙනෙක් අදාල කාල සීමාව ඉක්මවා වසර 09 සිට 27 දක්වා කාලයක් ද බලංගොඩ කලාපයේ ගුරුවරු 673 දෙනෙක් අදාල කාල සීමාව ඉක්මවා වසර 09 සිට 30 දක්වා කාලයක් ද එකම පාසලේ සේවයෙහි යෙදී තිබූ අතර, විගණිත දිනය වන 2009 දෙසැම්බර් 04 දක්වාම ඔවුන් ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

2.7 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.7.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

--------------------------------------------------

පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්කයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවල දි නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව/ වර්ග ප්‍රමාණය | වටිනාකම | නිෂ්ක්‍රියව පැවති කාලය |
|---|---|---|---|---|
| | ------------ | ---------- | ---------- | -------------- |
| | | | රු. | අවුරුදු |
| (අ) | ගොඩනැගිලි | 06 | 8,514,385 | 03 |
| (ආ) | වාහන | 09 | 33,100,000 | 03 |
| (ඇ) | යන්ත්‍රෝපකරණ | 39 | දැක්විය නොහැක | 03 |
| (ඈ) | කාර්යාල උපකරණ | 503 | 9,434,385 | 03 |
| (ඉ) | වෙනත් | 212 | 111,877 | 03 |

2.7.2 සමීක්ෂණය නොකළ වත්කම්

---------------------------------

මුදල් රෙගුලාසි 756 අනුව පළාත් සභා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 02 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.7.3 ලැබිය යුතු ගිණුම්

------------------

2009 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.19,367,275 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.12,260,143 ක් විය.

2.7.4 නිරවුල් නොකළ අත්තිකාරම්

--------------------------------

2009 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අත්තිකාරම් වටිනාකම රු.19,075,389 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.14,389,941 ක් විය.

2.7.5 අයවීමට ඇති සේවක ණය

-----------------------------

2009 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.99,703,751 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.17,926,984 ක් විය.

2.8 වාහන උපයෝජනය

-------------------------

2006 ජනවාරි 04 , 2006 ඔක්තෝබර් 23 , 2007 නොවැම්බර් 19 දිනැති ශ ලංකා ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ හා 2009 සැප්තැම්බර් 02 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් ඇමතූ ලිපිය අනුව ප්‍රධාන අමාත්‍යවරයාට ආරක්ෂක රථය ද ඇතුළුව වාහන සංඛ්‍යාව 03 කට හා රියදුරු සංඛ්‍යාව තනතුරු 03 ක් සඳහා සහ මාසයකට භාවිතා කළ හැකි ඉන්ධන ප්‍රමාණය ලිටර් 1700 (ඩීසල් ) කට සීමා වේ. ප්‍රධාන අමාත්‍යවරයා ට අදාල එකී සියලු වියදම් ප්‍රධාන අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් ගෙවා තිබිය දී ත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව භාරයේ පවතින අංක 63-4247 දරන වෑන් රථය 2008 මැයි 05 දින සිට ප්‍රධාන අමාත්‍යවරයාගේ කටයුතු වෙනුවෙන් නිදහස් කර තිබුණු අතර, එදින සිට 2009 ජනවාරි 20 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඉන්ධන හා ටයර් යෙදීම වෙනුවෙන් රු.334,367 ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවීම් කර තිබුණි. එකී වාහනයට අදාල ධාවන සටහන් 2009 ජනවාරි 20 දිනෙන් පසුව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.9 හඳුනා ගත් පාඩු හා හානි

------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයන්හි පවත්වා තිබූ තොරතුරු අනුව රු.263,021 ක අගයකට වූ පාඩු හා හානි අනාවරණය වී තිබුණි.

2.10 ද්‍රව්‍ය වංචනික ගනුදෙනු

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇඹිලිපිටිය ගුරු මධ්‍යස්ථානයේ පවත්වන ලද සේවාස්ථ පුහුණු සැසි 04 ක් සඳහා එකී මධ්‍යස්ථානයේ පැවැති පැමිණීමේ ලේඛන අනුව සහභාගී වූ ප්‍රමාණයට වඩා වැඩි සහභාගි වන්නන් ප්‍රමාණයකට එකතුව රු.24,200 ක් වූ වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ආ) 2009 ජනවාරි සිට ඔක්තෝබර් 30 දක්වා වූ කාල පරිච්ඡේදය තුල වාහනයකට ඉන්ධන යෙදීම් වෙනුවෙන් රු.173,038 ක් වැය කර තිබුණු අතර, නියැදියක් ලෙස ජනවාරි, අප්‍රේල් හා ජූලි මාස වල දී එකතව රු.75,886 ක් වූ ඉන්ධන මිල දී ගැනීම් ධාවන සටහන් සමඟ සැසඳීමේ දි රු.22,108 ක් වූ ඉන්ධන ලීටර් 311.16 ක් ධාවන සටහන්වලට ඇතුලත් කර නොතිබීම නිසා එකී ඉන්ධන වාහනයට යෙදීමෙන් තොරව සාවද්‍ය ලෙස ඉන්ධන බිල් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) කේ.එච්. 3881 හා ජේ.කේ. 2044 වාහන දෙක පමණක් පළාත් කෘෂිකර්ම ඇමතිවරයා විසින් භාවිතා කරමින් තිබියදී ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් භාවිතා කරන 32-4179 වාහනය ආරක්ෂක රථය ලෙස භාවිතා කරන බව දක්වමින් 2009 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.428,100 ක් ඉන්ධන දීමනාවක් ලබාගෙන තිබුණි.

2.11 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙල්ගොඩ එලවැල්ල පාලම සෘජු ශ්‍රම පදනම මත ඉදිකිරීම සඳහා රු.89,581 ක වියදමක් දරා තිබුණ ද, පසුව එය කොන්ත්‍රාත් පදනම මත ඉටු කරීම් සඳහා ටෙන්ඩර් කැඳවා තබුණු බැවින් ඉහත කී මුදල ඵලදායි නොවූ වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) සහභාගී වන්නන් සඳහා දීමනා ගෙවා තිබිය දී සැසි 12 ක් වෙනුවෙන් දිවා ආහාර සැපයීම සඳහා ද රු.121,025 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය , පරිසර කටයුතු සහ ධීවර අමාත්‍යාංශයේ ඇමතිවරයා වෙනුවෙන් සබරගමුව පළාත් සභාවේ, සියළු යන්ත්‍ර උපකරණ හා ගෘහ උපකරණ අයිතම 46 කින් සමන්විත අංග සම්පූර්ණ කාර්යාලයක් රත්නපුරයේ ස්ථාපිතව පැවතියදීත් කැගල්ල උප කාර්යාලයක් පවත්වාගෙන

යාම වෙනුවෙන් රු.1,382,714 ක් වැය කරමින් එම වර්ගයේම යන්ත්‍ර උපකරණ , ගෘහ උපකරණ හා පරිගණක උපාංග මිල දී ගෙන තිබුණි.

(ඉ) 2008 පෙබරවාරි 12 දිනැති සබරගමුව පළාත් සහා ක්‍රීඩා යෞවන කටයුතු, කාන්තා ධීවර, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලිපිය මගත් නවනගර ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඇඳුම් මාරු කරන ස්ථානය හා රථ ගාල ඉදිකිරීම අත්හිටුවීමට දෙන ලද උපදෙස් මත රථ ගාල ඉදිකිරීම අතරමඟ අත්හිටුවා තිබු අතර, එදින වන විට එම ඉදිකිරීම් සඳහා රු.114,137 ක අත්තිකාරම් මුදල් සහ රු.14,303 ක් වූ කොටස් මුදල් ගෙවා තිබුණි.

2.12 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොව ගනුදෙනු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරක් නොවූ සනිපාරක්ෂක තනතුර සඳහා 2001 වර්ෂයේ සිට එකම සේවකයකු කොන්ත්‍රාත් පදනම මත පත් කර, ඔහු ස්ථිර කරීම සඳහා 2005 ඔක්තෝබර් 07 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර, 2005 ඔක්තෝබර් 18 දිනැති අංක ඩී.එම්.එස්./පීස සහ එල් ජී/6/(iv) දරන කළමනාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් එම සේවය පෞද්ගලික අංශයෙන් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී තිබුණ ද, එම උපදෙස් පිළිපැදීමෙන් තොරව එම පුද්ගලයාම දිගටම සේවයේ යොදවමින් 2009 දෙසැම්බර් දක්වා එකතුව රු.420,293 ක් වූ දීමනා ගෙවා තිබුණි.

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ස්ථිර රියදුරුවරයකු 2008 ඔක්තෝබර් සිට 2009 මැයි දක්වා ප්‍රධාන අමාත්‍යවරයා වෙත මුදා හැර තිබුණු අතර, එකතුව රු.137,840 ක් වූ වැටුප් හා වේතන ගෙවා තිබුණි. 2009 ජූනි මාසයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් රියදුරකු හට එදින සිට විගණන දිනය වූ 2009 ඔක්තෝබර් 30 දක්වා එකතුව රු.84,850 ක් වූ ගෙවීම් ද කර තිබුණි.

(ඇ) 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ් / පී1/40 ජනාධිපති චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාර ප්‍රධාන අමාත්‍යවරයාට හිමි වනුයේ කාර්යාල දූරකථන 02 ක් වුවත්, දූරකථන 03 ක් භාවිතා කිරීම නිසා දූරකථන වියදම් රු.35,315 ක් වැඩිපුර දරා තිබුණු අතර, නිවාස දූරකථන 02 හා ජංගම දූරකථනය සඳහා මාසික සීමාව පිළිවෙලින් රු.10,000 ක් හා රු.4,000 ක් වුවත්, අදාල සීමාව ඉක්මවා 2009 වර්ෂයේ දි පිළිවෙලින් රු.434,953 ක් හා රු.171,400 ගෙවා තිබුණි.

2.13 අවිධිමත් ගනුදෙනු

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 මැයි මස 16 දින ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය තැපැල් කාර්යාලය සඳහා විදුලි ගාස්තු වශයෙන් මසකට රු.1,200 ක් අය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ නමුත් නියෝජිත තැපැල් කාර්යාලය (නිමාලි නියෝජිත ආයතනය) සමඟ ඇති කර ගත් ගිවිසුමට ඇතුළත් කර තිබුණේ වර්ෂයකට රු.1,200 ක මුදලක් වශයෙනි. ඒ අනුව 2007 මැයි 30 දින සිට 2009 මැයි 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.33,000 ක මුදලක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ආ) පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛ අංක : මුදල් 01/2001 යටතේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට පරිගණකයක් ද ඇතුළුව කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා රු.250,000 ක උපරිම සීමාවකට යටත්ව ණය මුදලක් ලබා දී ඇති අතර, 2008 ඔක්තෝබර් 08 දිනැති අංක 2008/59 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් එකී උපරිම ණය සීමාව රු.500,000 දක්වා වැඩිකර ණය මුදල් ලබා ගෙන තිබිය දී පළාත් සභා මුදලින් මන්ත්‍රීවරුන් 44 දෙනෙකු සඳහා රු.5,236,000 ක් වටිනා පරිගණක 44 ක් මිල දී ගෙන තිබුණි.

(ඇ) 2006 ජනවාරි 04 දිනැති අංක: සීඑස්ජ්/පී1/40 අංක දරන රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව ජනාධිපති විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය පරිදි පළාත් සභා සභාපතිතුමාගේ මාසික ඒකාබද්ධ නිල දුරකථන සීමාව රු.17,000 ක් වූ නමුත්, 2009 ජූනි 17 දිනැති ආණ්ඩුකාර ලේකම්ගේ අංක 10/4/3/73(II) දරන ලිපිය මගින් ඒකාබද්ධ මාසික නිල දුරකථන වියදම සීමාව රු.40,000 දක්වා සංශෝධනය කර තිබුණු අතර, ඉහත ලිපිය පරිදි 2009 ජූලි 01 දින සිට මාසික නිල දුරකථන සඳහා සභාපතිතුමාට හා උප සභාපතිතුමාට පිළිවෙලින් රු.40,000 ක හා රු.30,000 ක දීමනාවක් ගෙවනු ලබන අතර, 2009 දෙසැම්බර් දක්වා සභාපතිතුමාගේ හා උප සභාපතිතුමාගේ පිළිවෙලින් රු.79,035 ක් හා රු.12,951 ක් වූ කාර්යාල දුරකථන වියදම සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

(ඈ) බලංගොඩ, වරකාපොළ සහ කහවත්ත යන මූලික රෝහල් සඳහා 2009/2010 වර්ෂය සඳහා පවිත්‍රතා කටයුතු පෞද්ගලික අංශයට පැවරීම සඳහා වූ ප්‍රසම්පාදන ඇගයීමේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ නීති, රීති හා 2008 ජූලි සිට ක්‍රියාත්මක කළ යුතු සංශෝධිත පඩිපාලක සභා ආඥා පනත අනුව අවම වැටුප් ගණනය කිරීම වෙනුවට අතිකාල ඇතුළුව උපරිම වැටුප සැලකිල්ලට ගැනීම නිසා අවම මිල ඉදිරිපත් කර තිබුණු ප්‍රසම්පාදන ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඊට වඩා වැඩි මිලක් වෙත ප්‍රසම්පාදන පිරිනමා තිබීම හේතුවෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සමාලෝචිත වර්ෂය සඳහා රු.250,570 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ඉ) සබරගමුව පළාතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල 02 ක හා රෝහල් 11 ක ආරක්ෂක සේවා කටයුතු පෞද්ගලික අංශයට පැවරීම සඳහා වූ ප්‍රසම්පාදන ඇගයීමේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ,රීති හා 2008 ජූලි සිට ක්‍රියාත්මක කළ යුතු සංශෝධිත පඩිපාලක සහා ආඥා පනතට අනුව අවම වැටුප් ගණනය කිරීම වෙනුවට අතිකාල ඇතුළත් කර උපරිම වැටුප සැලකිල්ලට ගෙන, අවම මිල ඉදිරිපත් කර තිබුණු ප්‍රසම්පාදන ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඊට වඩා වැඩි මිලක් වෙත ප්‍රසම්පාදන පිරි නමා තිබීම හේතුවෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වර්ෂයකට රු.2,381,616 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. 2008 වර්ෂයේ දී ප්‍රසම්පාදන පිරිනමා තිබූ ආයතන සම්බන්ධයෙන් රෝහල් බලධාරීන් විසින් වගකිව යුතු නිලධාරීන් වෙත පැමිණිලි කර තිබිය දී ත් 2009 වර්ෂයේ දී ද එම ආයතන වෙතම ප්‍රසම්පාදන පිරිනමා තිබුණි. 2009 වර්ෂයේ දී ද පැමිණිලි වාර්තා වී තිබුන ද එම පැමිණිලි සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) Panasonic KXF 937 වර්ගයේ ෆැක්ස් යන්ත්‍ර 08 ක් එකක් රු.15,900 ක මිලකට යුනිවෝකර්ස් ලිමිටඩ් වෙතින් ඇනවුම් කර තිබිය දී එම වර්ගයට වඩා රු.2,000 කින් මිල අඩු වූ KXFT 983 වර්ගයේ ෆැක්ස් යන්ත්‍ර මිල දී ගෙන Panasonic KXF 937 වර්ගයේ ෆැක්ස් යන්ත්‍රයක අදාල මිල ගෙවීම හේතුවෙන් රු.16,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(උ) 2003 ජූනි 19 දිනැති අංක සිඑම්/ඒඩී/7/1/7 චක්‍රලේඛය ප්‍රකාර විෂය අධ්‍යක්ෂවරුන් සිටින සෑම අවස්ථාවකම අදාල සැසිය පැවැත්වීම, සංවිධානය හා මෙහෙයවීම ඔහු විසින් සිදුකළ යුතු අතර, ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12.7 වගන්තිය ප්‍රකාර නිලධාරියෙකුට ඔහුගේ නිත්‍ය තනතුරට හිමි දීමනා පමණක් ගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව වැඩ ආවරණය කරන සහකාර අධ්‍යක්ෂවරු වෙත අදාල දීමනා ලෙස රු.116,000 ක් ගෙවා තිබුණි.

(ඌ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13 වගන්තිය අනුව සුදුසුකම් සම්පූර්ණ නොකල නිලධාරීන් සහකාර අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි. VII පරිච්ඡේදයේ 12.7 වගන්තිය පරිදි දීමනා ගෙවීමේ දි නිත්‍ය තනතුරට හිමි දීමනාව පමණක් ගෙවිය හැකි වුවත්, ඊට පටහැනිව ලෙස සහකාර අධ්‍යක්ෂ තනතුරට හිමි රු. 2,400 ක පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම නිසා 2009 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.168,000 ක් වූ වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(එ) පළාත් ආයුර්වේද කොමසාරිස් කාර්යාලයේ සනීපාරක්ෂක සේවා පවත්වාගෙන යාමේ කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2009 ජූනි 26 සිට 2009 දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පමණක් ගිවිසුම් අත්සන් කර තිබිය දී 2009 අප්‍රේල් 01 දින සිට 2009 ජූනි 26 දින දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් අනුමැතියකින් තොරව රු.299,511 ක් එකී ආයතනය වෙත ගෙවා තිබුණි.

(ඒ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ කැබ් රථ දෙක සඳහා අමතර කොටස් යෙදීම වෙනුවෙන් රු.311,746 ක් වැය කර ඇතත්, ඉවත් කළ කොටස් ආපසු භාර දී නොතිබුණි.

(ඔ) මුදල් රීති 85.3 පරිදි ගෙවීම් වවුචර් අනුමත කිරීමේ දී අදාල රේට් ගණන් සාධාරණ හා යුක්ති සහගත ද යන්න සෑහීමකට පත්විය යුතු වුවද, අගෝස්තු මාසයේ සිට ඩීසල් වාහනය භාවිතා කිරීමට හැකියාව තිබිය දී

පෙට්‍රල් වාහනයට අමතර ඉන්ධන යෙදූ බවට දක්වමින් මාස 05 ක් සඳහා රු.114,000 වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) 2009 මැයි හා ජූනි මාස වල කෘෂිකර්ම ඇමතිවරයා විසින් භාවිතා කරන ලද J.K.2044 පෙට්‍රල් වාහනය අළුත්වැඩියාව සඳහා යොදවා තිබිය දී ඒ වෙනුවට P.B. 6047 ඩීසල් වාහනය පාවිච්චි කර තිබුණි. ඩීසල් වාහනය වෙනුවෙන් මාසයකට ඩීසල් ලීටර් 400 ක් පමණක් ලබා ගත හැකිව තිබිය දී ඊට පටහැනි ලෙස එම අදාල ඩීසල් ලීටර් 400 ට අමතරව මැයි මාසයේ දී මුදලින් හිඟ ලෙස රු.25,000 ක් හා ජූනි හා ජූලි මාස සඳහා රු.14,620 ක් ලබා ගැනීම නිසා එකතුව රු.39,620 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

(ක) කොන්ත්‍රාත් ගිවිසුමේ 04 ඡේදය ප්‍රකාර පිළිගත හැකි යෝග්‍ය හේතූන් නොමැතිව කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකරන්නේ නම් පූර්වෝක්ත වැඩය පූර්වෝක්ත දිනයට හෝ දීර්ඝ කරන ලද දිනට අවසන් කර භාර දීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් එදින සිට ගතවන සෑම සතියකටම ගිවිසුම්ගත මුදලින් 0.1% ක් බැගින් එකතුව රු.488,016 ක් වූ දඩ මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතු වුවත්, එසේ කිරීමකින් තොරව අවසන් බිල ඉදිරිපත් කළ 2008 අගෝස්තු 27 දිනට පසුව එනම්, 2008 සැප්තැම්බර් 02 දින නව ගිවිසුමක් අත්සන් කොට 2008 නොවැම්බර් 02 දින වන විට එය අවසන් කර භාර දීමට ගිවිසුම් ගත කර තිබුණු අතර, රු.981,582 ක් වූ ඉහත අවසන් බිල ගෙවීමේ දි රු.229,125 ක් වූ ඉතිරි අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) 2002 අගෝස්තු 29 දිනැති අංක II/719/E203/117 දරන ආයතන අධ්‍යක්ෂකගේ චක්‍රලේඛයට පටහැනිව ලෝක බැංකු ණය ආධාර යටතේ මධ්‍යම රජයෙන් සපයනු ලබන අරමුදල් යටතේ 2009 මැයි සිට නොවැම්බර් 30 දක්වා ඇඹිලිපිටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ එකතුව රු.421,251 ක් ගෙවීම් කරමින් සේවාස්ථ සැසි 27 ක් සඳහා 2008 ජූලි 28 දිනැති ආ.කා./10/7/ඒ/8 දරන සබරගමුව ආණ්ඩුකාර චක්‍රලේඛය පදනම් කරගෙන කටයුතු කිරීම නිසා, සහභාගීත්වයන් සඳහා හා සම්පත් දායක දීමනා සඳහා එකතුව රු.65,800 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.14 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් නිල නිවාස පිහිටි භූමිය තුළ අනවසර වෙළඳසැල් කිහිපයක් ඉදිකර තිබූ නමුත්, ඔවුන් ඉවත් කිරීම සඳහා නීතිමය පියවරක් ගෙන නොතිබුණි. තවද, කහවත්ත වැල්අඳුර පිහිටි කම්කරු නිල නිවාසයේ පිටස්තර පුද්ගලයෙකු පදිංචි වී සිටින බව අනාවරණය විය.

(ආ) කලවාන විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් දැල පිහිටි ලිපිකරු නිල නිවාසයේ බාහිර පුද්ගලයෙකු පදිංචි වී සිටින අතර, වේවැල්කඳුර පිහිටි නිල නිවාසය හා ඉඩම බාහිර පුද්ගලයෙකු විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණ ද, ඒ සම්බන්ධව නීතිමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ලේඛනය අනුව රත්නපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සමිති 613 න් 2010 පෙබරවාරි 05 දිනට 2009 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර තිබුණේ සමිති 51 ක් පමණක් වූ අතර, එය මුළු සමිති සංඛ්‍යාවෙන් 8% ක් ද 2009 වර්ෂයේ දි අධීක්ෂණයට ලක් වී තිබුණේ විවිධ සේවා සමුපකාර සමිති 19 ක් ස:ණ:ස: සමිති 61 ක් හා වෙනත් සමිති 21 ක් පමණක් වූ අතර, එය මුළු ලියාපදිංචි සමිති සංඛ්‍යාවෙන් 16% ක් ද විය.

(ඈ) ලෝක බැංකු ණය ආධාර යටතේ මධ්‍යම රජයෙන් සපයනු ලබන අරමුදල් යටතේ වැය විෂයයන් 05 ක් සම්බන්ධයෙන් 2009 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා එකතුව රු.3,052,123 ක් වැය කරමින් සේවාස්ථ සැසි 56 ක් සඳහා 2002 අගෝස්තු 29 දිනැති අංක II/719/E203/117 දරන ආයතන අධ්‍යක්ෂගේ චක්‍රලේඛයට පටහැනි ලෙස 2008 ජූලි 28 දිනැති ආ.කා./10/7/ඒ/8 දරන සබරගමුව ආණ්ඩුකාර චක්‍රලේඛය පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා, සහභාගීත්වයන් සඳහා හා සම්පත් දායක දීමනා සඳහා එකතුව රු.245,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) සේවාස්ථ සැසි පැවැත්වීමේ දි අපේක්ෂිත වූ සහභාගීවන්නන් ප්‍රමාණයෙන් 40 % සිට 78% දක්වා අඩු සහභාගීත්වයක් යුතුව අවස්ථා 29 ක දි සේවාස්ථ සැසි පවත්වා තබීම නිසා බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඊ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, ඇඹිලිපිටිය මූලික රෝහල හා රත්නපුර ලය රෝහලේ පවිත්‍රතා කටයුතු පෞද්ගලික අංශයට පැවරීම සඳහා වූ ප්‍රසම්පාදන ඇගයීමේ දී සේවකයින් සඳහා විධිමත් අර්ථසාධක ගෙවීම ප්‍රධාන සාධකයක් ලෙස සලකා අවම මිල ලබා දුන් ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණ ද, සේවක අර්ථසාධක අරමුදලින් ලබාගත් තොරතුරු අනුව තෝරා ගත් ආයතනය විසින් ද විධිමත්ව අර්ථසාධක අරමුදල් නොගෙවන බව තහවුරු වීම නිසා ඇගයීම් මණ්ඩලයේ වැරදි තීරණ හේතුවෙන් වර්ෂයකට රු.329,489 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ඌ) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2003 හා 2005 වර්ෂවලදී ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවන ලද එකතුව රු.148,100 ක විදුලි දිගු ව්‍යාපෘති 2 ක් අවලංගු කර තිබුණත්, එම මුදල් ආපසු ගෙන්වා ගැනීමට 2010 ජනවාරි 11 දිනය වන විටත්, කටයුතු කර නොතිබුණි.

(ඍ) සබරගමුව පළාත් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි කාර්මික සංවර්ධනයට අදාල ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම සහ කර්මාන්ත, වාණිජ හා ව්‍යාපාර කටයුතු සහ වෙනත් ව්‍යාපෘති දිරි ගැන්වීම , නගා සිටුවීම හා සංවර්ධනයට උපකාරි වීම හා ඊට අදාල දෑ ඉටු කිරීම යන කාර්යයන් සඳහා පිහිට වූ සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ගිණුම් ඉදිරිපත් කිරීමේ කාල සීමාවන් පිළිබඳ අදාල ප්‍රතිපාදන, ප්‍රඥප්තිය මගින් සළසා නොතිබුණි. 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ වාර්ෂික අවසන් ගිණුම් (බලවින්න කොන්ක්‍රීට් අංගනය ඇතුළත්ව) 2010 මාර්තු 01 දින වන විටත් ඉදිරිපත් නොකෙරුණි. අවසාන ගිණුම් ඉදිරිපත් කර තිබුණේ ද 2003 ජනවාරි 01 දින සිට 2004 අගෝස්තු 30 දින දක්වා වූ මාස 20 ක කාල පරිච්ඡේදයක් සඳහා පමණි.

(එ) අක්කර 85 ක ප්‍රමාණයෙන් යුතු කුරුවිට පැරඩයිස් කර්මාන්ත පුරයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දි තිබුණු ඉඩම් 12 ක් සම්බන්ධයෙන් 2009 ඔක්තෝබර් 01 දින වන විට එකතුව රු.2,051,160 ක හිඟ බදු මුදල් අයකර ගැනීමට හෝ බදු ගිවිසුම් අවලංගු කර වෙනත් සුදුසු පුද්ගලයින් හඳුනාගෙන නැවත බදු දීම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණු අතර, ආයතන 15 ක් ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇති අතර එම ඉඩම් නීත්‍යානුකූලව ඔවුන් වෙත ලබා දීමට හෝ බදු කුලී අයකිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඒ) කුරුවිට පැරඩයිස් කර්මාන්ත පුරවරයේ පැල්කොම් ඉන්ඩස්ට්‍රීස් වෙත බදු දී තිබුණු ඉඩම හා ඉදිකර තිබුණු ගොඩනැගිලි අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව වෙත උකස් කර තිබූ අතර, 2000 නොවැම්බර් 28 දින වන විටත් බැංකුව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ එකී ඉඩමේ බදු අයිතිය විකුණා තිබුණි.

(ඔ) කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 161 එරත්න ග්‍රාම නිලධාරී වසමේ පර්චර්ස් 29 ක රජයේ ඉඩම් කොටසක් අවුරුදු 30 ක දීර්ඝකාලීන බදු යටතේ ලබා දී ඇතත්, බදු ගිවිසුම අනුව බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, පැහැර හැරීම් කළ අවස්ථාවලදී ගිවිසුම ඉබේටම අහෝසි වන බව දන්වා ඇතත්, 1995 සිට 2009 දක්වා බදු කුලී හා දඩ පොලිය එකතුව රු.60,235 ක් අය කරගෙන නොතිබුණු, අතර, ගිවිසුම අවලංගු කර භුක්තිය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුණසිංහපුර පිහිටි අවසර පත්‍රයක් මගින් පවරා දී තිබූ ඉඩම සඳහා 1997 ඔක්තෝබර් 16 දිනැති ජනපද නිලධාරීගේ පරීක්ෂණ වාර්තාව මගින් අදාල ඉඩමෙහි පදිංචි පවුල් දෙකටම ඔවුන් භුක්ති විඳින ආකාරයටම අදාල ඉඩම බෙදා වෙන් කර පවරාදීම සුදුසු බව වාර්තා කර තිබිය දී ත් වගකිව යුතු නිලධාරීන්ගේ

ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එබැවින් පීඩාවට පත් වූ පාර්ශවය විසින් නෛතික ක්‍රියා මාර්ග ගැනීමෙන් පළාත් ඉඩම් කොමසාරිස් වරයාට ඇරීමට සිදු වූ රු.72,000 ක නීතිඥ ගාස්තු අදාල නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ක) ව්‍යාපෘති අරමුදල් භාවිතා කර සිදුකරනු ලබන මිල දී ගැනීම් වලට අදාල දේශීය බදු, විදේශ ප්‍රදාන යටතේ දැරිය නොහැකි වුවද, එයට පටහැනිව සෞඛ්‍ය අමාත්‍යාංශය හා රත්නපුර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.23,623,966 ක මිල දී ගැනීම් වෙනුවෙන් රු.1,303,411 ක බදු මුදල් ව්‍යාපෘති අරමුදලින් ගෙවා තිබුණි.

## 2.15 කාර්ය සාධනය

### 2.15.1 රජයේ ප්‍රදාන

පළාත් සහා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | ප්‍රතිපාදනය | වියදම | ඌන උපයෝජනය/ (අධි උපයෝජනය) |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | උපමාන පාදක ප්‍රදාන | 415,639,000 | 311,485,000 | 104,154,000 |
| ii. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2,258,700,000 | 1,389,328,607 | 869,371,393 |
| iii. | සාමූහික ප්‍රදාන | 9,337,152,184 | 8,493,000,000 | 844,152,184 |
| iv. | ලෝක බැංකු ප්‍රදාන | - | 197,924,953 | (197,924,953 ) |

2.15.2 පළාත් සංවර්ධන සැලැස්ම.

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ රු.1,240,026,617 ක අගයකට වූ වැඩ යෝජනා 4570 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනා වල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|---|
| | | ------- | ------- | ------- |
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 2579 | 955 | 3534 |
| (ආ) | 50% කට වඩා අඩුවෙන් නිමකළ | 200 | 66 | 266 |
| (ඇ) | 50% කට වඩා වැඩියෙන් නිමකළ | 194 | 62 | 256 |
| (ඈ) | ආරම්භ කර නොතිබූ | 416 | 45 | 461 |
| (ඉ) | මතභේදයට/ ප්‍රශ්නාකාරී තත්ත්වයන් යටතේ වූ | 9 | 24 | 33 |
| | එකතුව | 3398 | 1152 | 4550 |

* ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාලව ව්‍යාපෘති 20 කට අදාලව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

2.16 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

2.16.1 ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

--------------------------------------------------------

පහත දැක්වෙන ව්‍යාපෘති /යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

| | ව්‍යාපෘතිය / යෝජනා ක්‍රමය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2009 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | ------------- | ------------ | ------- | ---------- | --------------------- |
| | | රු. | | රු. | |
| (අ) | හේවාදිවෙල තලංපිටිය මාර්ගය | 2,341,856 | 2007.09.25 | 610,314 | පළාත් සභාවෙන් තාර නොසැපයීම |
| (ආ) | පනාවල මානියම්ගම මාර්ගය | 6,784,007 | 2007.09.10 | 1,714,885 | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | සීපොත් නාගස්තැන්න මාර්ගය | 3,553.106 | 2007.09.17 | 1,204,546 | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |
| (ඈ) | මඩවල හන්දියේ සිට වටවල මාර්ගය | 4,447,908 | 2007.10.11 | 975,088 | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |

2.16.2 සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ව්‍යාපෘති/ යෝජනා ක්‍රම

--------------------------------------------------------

පහත සඳහන් ව්‍යාපෘති / යෝජනා ක්‍රම සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

| | ව්‍යාපෘතිය / යෝජනා ක්‍රමය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2009 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම | අත්හැර දැමීමට හේතුව |
|---|---|---|---|---|---|
| | ------------------ | ----------- | ------------ | ----------- | -------------- |
| | | රු. | | රු. | |
| (අ) | කොලොන්න ජාතික පාසැලේ කෘෂි විද්‍යාගාරය ඉදිකිරීමේ කර්මාන්තය | 1,725,803 | - | 630,463 | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |
| (ආ) | උඩුමුල්ල හතැටිපාන කන්ද මාර්ගය | - | 2009 මාර්තු 26 | - | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |
| (ඇ) | අන්නාසිගල බොලගම මාර්ගය | - | 2010 ජනවාරි 12 | - | පළාත් සභාවෙන් තාර නොසැපයීම |
| (ඈ) | දැරණයගල බණ්ඩාරවත්ත කම්බි පාලම II අදියර | - | ආරම්භ කර නොතිබුණි | 960,475 | කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර ඇත. |

2.16.3 ඉදිකිරීම්

---------

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(අ) කැප්පෙට්ටිය මණ්ඩිය වැවගම මාර්ගය වැඩි දියුණු කිරීමේ කර්මාන්තයෙහි පළමු තාර ආලේපය සිදුකර මාස තුනක් ගත වී තිබුණ ද, දෙවන වර තාර ආලේපය නොකිරීම නිසා 2009 අගෝස්තු 27 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මාර්ග තලයේ බොහෝ ස්ථානවල වළවල් සෑදී කඩතොළු වී තිබුණු අතර මාර්ගයේ සංවර්ධන කටයුතු 2009 මැයි 30 දින නතර කර තිබුණ ද, 2009 ජූනි 22 දින ලීටර් 200 තාර බැරල් 15 ක් කාර්මික

නිලධාරී වෙත නිකුත් කර තිබුණු අතර, ඉන් බැරල් 04 ක් කාර්මික නිලධාරී විසින් ඉවත් කර ගෙන ගොස් තිබුණි.

(ආ) රු.11,163,000 කට ගිවිසුම් අත්සන් කර 2008 ඔක්තෝබර් 20 දින ඉදිකිරීම් නිමකර භාර දී තිබුණු අරණායක රෝහලේ භාහිර රෝගී අංශය හා වාට්ටු සංකීර්ණය 2009 පෙබරවාරි 17 දින වන විට ද පාවිච්චියට ගෙන නොතිබූ අතර, සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත මාලයෙහි ඉදිරිපස බිත්තිය ඇතුලත හා පිටත සියුම් පිපිරුම් අවස්ථා 13 ක් දක්නට ලැබුණු අතර, බිත්තිවල පිටත කපරාරුවේ සමහර ස්ථාන අතින් අල්ලන විට ද බදාම ගැලවෙන ස්වරූපයේ පැවැතුණි.

(ඇ) 2008 පෙබරවාරි 26 දින ඉදිරිපත් කරන ලද ළිඳ ඉදිකිරීමේ සංශෝධිත සැලැස්මට අනුව නව නගර ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ළිඳ ඉදි නොකිරීම නිසා භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතින අතර, ඒ සඳහා වැය කල රු.1,758,581 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී ඇති බව 2009 දෙසැම්බර් 27 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

---------------------

විගණනයේ දි නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානින් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය
(ආ) වත්කම් හා මානව සම්පත් .
(ඇ) ගබඩා පාලනය.
(ඈ) කොන්ත්‍රාත්.
(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.